කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

නිවේදන අංකය : **01** WW/O/20/05/25/01
වර්ණය : ඇම්බර්

# තද වැසි, තද සුළං සහ රළු මුහුද පිළිබඳව දැනුවත් කිරීම

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ, ස්වභාවික විපත් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය විසින්
2020 මැයි මස 26 වන දින ප.ව. 01.30 වන තෙක් වලංගු වන පරිදි
2020 මැයි මස 25 වන දින ප.ව. 01.30 ට නිකුත් කරන ලදී.

## හම්බන්තොට සිට පොතුවිල් දක්වා වන මුහුදු ප්‍රදේශ සඳහා

## සැලකිලිමත් වන්න!

හම්බන්තොට සිට පොතුවිල් දක්වා වන මුහුදු ප්‍රදේශයේ පවතින ක්‍රියාකාරී වලාකුළු පද්ධතිය හේතුවෙන්, ඉහත සඳහන් මුහුදු ප්‍රදේශවල තද වැසි ඇතිවිය හැකි අතර ගිගුරුම් සහිත වැසි සමඟ සුළං වේගය ක්ෂණිකව (පැ.කි.මී. **70-80** පමණ) ඉහළ යාමට ඉඩ ඇති හෙයින් එම මුහුදු ප්‍රදේශ ක්ෂණිකව රළු වීමට වැඩි හැකියාවක් පවතී.

ධීවර සහ නාවුක ප්‍රජාවට මේ පිළිබඳව ඉතා අවධානයෙන් කටයුතු කරන ලෙසත් ඉල්ලා සිටිනු ලැබේ.




## අද ප.ව **1.30** වනවිට තත්ත්වය

දිවයිනට ගිනිකොණ දෙසින් වන මුහුදු ප්‍රදේශවල ක්‍රියාකාරී වලාකුළු පද්ධතියක් වර්ධනයවී පවතී.

## අනාවැකිය

මෙම ක්‍රියාකාරී වලාකුළු පද්ධතිය තවදුරටත් සක්‍රියව පවතිනු ඇතැයි බලාපොරොත්තු වේ.